සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2018** | **10 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 10** |
| **Third Term Test 2018** | **Grade 10** |

| | |
|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **පැය දෙකයි** |
| **சிங்களமொழியும் இலக்கியமும்** | **இரண்டு மணித்தியாலயம** |
| **Sinhala Language and Literature** | ***Two hours*** |

විභාග අංකයඃ- ..................................

**11 පත්‍රය**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. i) සිංහල හෝඩියේ ඇතුළත්
   (අ) කෙටි ස්වර (ආ) වර්ගාන්ත අක්ෂරය බැගින් ලියන්න.

   ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.
   (අ) දහමක් (ආ) ළඳුනට

   iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
   කුලීණ පන්ති හා පූජක කුළත් සමාජ විපර්යාස අපේක්ශා නොකළහ.

   iv) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
   (අ) දුර්ලභ (ආ) උතුම්

   v) පහත සඳහන් පද කුමන පද වර්ගයකට අයත් දැයි දක්වන්න.
   (අ) සුකුමාර (ආ) වැඩුණු

   vi) පහත සඳහන් (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස්ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
   (අ) මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයෙකු වෙයි.
   (ආ) සොරු දෙදෙනෙක් අත්අඩංගුවට පත් විය.

   vii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස් වලට ගැලපෙන තනි පදය බැගින් ලියන්න.
   (අ) පිටතින් පැමිණි තැනැත්තා (ආ) ආඩම්බර නැති

   ix) පහත දැක්වෙන වාක්‍ය දෙක කර්තෘකාරකයට හරවා ලියන්න.
   (අ) වියතුන් විසින් පොත් ලියන ලදී. (ආ) දඩයම්කරුවා විසින් සාවෝ මරනු ලබති.

   x) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද දෙක තෝරා වෙනම ලියන්න.
   එය රසවත් මිහිරිතම ආහාරයක් බැවින් මම ඉතා ආශාවෙන් අනුභව කෙළෙමි.

2. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. වරහන් තුල ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) සංස්කෘතික උත්සව ආගමික සහජීවනයට හේතු වේ. බහු සංස්කෘතික රටක් වශයෙන් එම සහජීවනය නොවන්නට අප විවිධ ගැටලුවලට මුහුණපානු ඇත. මේ සමාජීය වශයෙන්වූ අන්‍යෝන්‍ය බැඳීම අද්විතීය වේ.

(ආ) මෙරට පාරසරික පද්ධතියට ප්‍රබල බලපෑමක් ඇතිකරන අංග අතර ඉවත ලන ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රමුඛවී ඇත. පරිසරයට මහත් තර්ජනයක් වන මේවායේ අවම භාවිතය ගැන කාගේත් අවධානය යොමුවිය යුතුය.

(ඉ) මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීම අද මුළු ලොවම සේම ශ්‍රී ලංකාවට ද අති මහත් තර්ජනයකි. වැඩිහිටියන් පමණක් නොව නව යොවුන් වියේ පසු වන පාසල් දරු දැරියන් ද මත් රකුසාගේ ගොදුරුවී අවසානය. බොහෝ ළමුන් ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත්ව ඇත. ශාරීරික සෞඛ්‍ය පිරිහෙනවා සේම මේ නිසා ඇති වන සමාජ ආර්ථික ප්‍රශ්න රාශියකි. මේ කෙරෙහි වගකිව යුත්තන්ගේ දෑස් විවර විය යුතු කාලය එළඹ

ඇත.

**3.** පහත සඳහන් පාඨය වචන 55-65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අද පවතින වෙළෙඳ ව්‍යාපාරවල එකම අරමුණ වී ඇත්තේ අධික ලෙස මුදල් ඉපයීමයි. මේ සඳහා වෙළෙන්දන් හැකි සෑම උපක්‍රමයක්ම යොදන අතර ඔවුන්ගේ අදහස් ක්‍රියාවට නංවන වෙළෙඳ දැන්වීම්කරුවෝද එය ඒ අයුරින්ම ක්‍රියාවට නගති. තරඟකාරී තත්වයට පත්ව ඇති මෙම වාණිජමය අරමුණු සේවා හා භාණ්ඩ මගින් ක්‍රියාත්මක වේ. පරිභෝගිකයා දිනා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන උපක්‍රම රටේ සංස්කෘතියට, සභ්‍යත්වයට හා අනාගත පැවැත්මට කෙතරම් හිතකර ද යන්න ගැන තැකීමක් නොකිරීම කනගාටුවට කරුණකි. මෙම වෙළෙඳ උපක්‍රමවලට සාමාන්‍ය ජනතාව පමණක් නොව දැන උගත් අය පවා රැවටෙන අවස්ථා අපමණය. අද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා පමණක් නොව විවිධ රූස්වීම් මගින් ද තම භාණ්ඩ හෝ සේවාව සැමටම වඩා වාසිදායක හා ලාභ බව පැවසීමට එහි නිරත වෙන කිසිවෙක් පසුබට නොවෙති. ඇත්ත නැත්ත වටහා ගැනීමට බැරි තරමට ප්‍රායෝගික දර්ශන පෙන්වනවා පමණක් නොව ඒ ගැන රස කරමින් කියන වාර ගණන ද අසීමිතය. ඔවුන්ගේ වාණිජ පරමාර්ථය මේ ආකාරයෙන් ඉටු වුවත් ඉන් සමාජයට වන බරපතල හානි අපමණය. ව්‍යාපාරිකයා පිනවා විශාල මුදලක් ලබා ගැනීමට උත්සාහ දරන දැන්වීම්කරුවා ජනතාවගේ සිත ආකර්ෂණය කර ගැනීමට වෙළෙඳ භාණ්ඩයේ නැති ගුණ වනයි. මාධ්‍ය ගැන විශ්වාසය තබා ඇති නිසා ඒවා පරිහරණය කිරීමට මිනිස්සු පෙලඹෙති.

**4.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

කාව්‍යය හා පද්‍යය අතර වෙනස තේරුම් ගැනීම සාහිත්‍ය පිළිබඳ දැනුමට අතිශයින් අවශ්‍යය. සිංහල සාහිත්‍යයෙහි පමණක් නොව වෙනත් බොහෝ සාහිත්‍යයන් හි දූත කාව්‍ය වශයෙන් ගැණෙන රචනාවන්ගෙන් වැඩි කොටසක් නියම වශයෙන් කාව්‍ය නොවන්නේ ය. බොහෝවිට කාව්‍ය වශයෙන් ගැණෙන්නේ පද්‍ය ස්වරූපයෙන් රචිත කථා ප්‍රවෘත්තිය. සෑම සාහිත්‍යයකම පාහේ මූලාරම්භයේ පහළ වූයේ පද්‍ය බන්ධන බව ශාස්ත්‍රඥයෝ පවසති. ශිෂ්ටාචාරයෙහි මුල් අවධියේ වූ කවියා තම අදහස් හා සිතුම් පැතුම් ප්‍රකාශ කළේ පද්‍ය මුඛයෙනි. ආදී මිනිසා ගද්‍ය රචනාවට බැස්සේ ඔහු පරිචය කරණ කොටගෙන වචන ව්‍යවහාරයේ දක්ෂයෙකු වූවායින් පසු ය. දඹදිව සාහිත්‍ය වංශයෙන් ද මෙය ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය. ඉන්දු ආර්ය ජනතාවගේ පළමු වැනි සාහිත්‍යය කෘතිය වශයෙන් අපට පෙනෙන්නට තිබෙන්නේ ඍග් වේදයයි. ඔවුන් ගද්‍ය රචනාවෙහි දැරූ පළමු වැනි ප්‍රයත්නයේ ප්‍රතිඵලය වශයෙනි. ඊට ශත වර්ෂ කිහිපයකට පසු බ්‍රාහ්මණ නම් ග්‍රන්ථ සමූහය බිහිවිය. බ්‍රාහ්මණ ග්‍රන්ථයන්හි විද්‍යාමාන වාග් විලාසය සලකන විට අපට සිහි වන්නේ ගද්‍ය රචනාවෙහි එතරම් පරිණත අවස්ථාවකට නොපැමිණියකුගේ ප්‍රයත්නයකි.

(1) බොහෝ විට කාව්‍ය වශයෙන් ගැනෙන්නේ කුමක්ද?

(2) හැම සාහිත්‍යයකම මුලින්ම ඇති වූයේ ගද්‍ය ද? පද්‍ය ද?

(3) ආදී මනුෂ්‍යයා ගද්‍ය රචනාව පටන් ගත්තේ කවර අවස්ථාවකද?

(4) ඉන්දු ආර්යයන්ගේ පළමු වැනි සාහිත්‍ය කෘතිය කුමක්ද?

(5) බ්‍රාහ්මණ ග්‍රන්ථයන් පහළ වූයේ කිනම් කලකද?

**5**. ඔබ සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා යැයි සිතා ලෝක වැඩිහිටි දිනය සඳහා පාසල් සිසුන් අතර රචනා තරගයක් සංවිධානය කළ යුතු බව ඔබ අමාත්‍යාංශයේ සහකාර ලේකම් (මානව සම්බන්ධතා) වෙත දැනුම් දීම සඳහා මෙමෝ පතක් සකස් කරන්න.